# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2462/32 - 2025 නොවැම්බර් මස 14 වැනි සිකුරාදා - 2025.11.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### තනතුරු - ඇබෑර්තු

### වයඹ පළාත් සභා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යක්ෂ හා විෂයානුබද්ධ විශේෂඥ තනතුර සඳහා බඳවා ගැනීම

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින අතිරේක පළාත් අධ්‍යක්ෂ හා විෂයානුබද්ධ විශේෂඥ තනතුර සඳහා පත්කිරීමට, වයඹ පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය සහ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි දැනට රාජ්‍ය සේවයෙහි හා පළාත් රාජ්‍ය සේවයෙහි නියුතු ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. සුදුසුකම්:**

***අතිරේක පළාත් අධ්‍යක්ෂ :***

- ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ වසර 03 සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියෙකු විය යුතුය.
- පශු වෛද්‍යවේදී මූලික උපාධියක් සහිත නිලධාරියෙකු විය යුතුය.
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- 2025.11.30 දිනට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

***විෂයානුබද්ධ විශේෂඥ :***

- ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ වසර 03 සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියෙකු විය යුතුය.
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- 2025.11.30 දිනට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

1A - PG 7346 — 04 (2025/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**සටහන** : අයදුම්පත් භාරගන්නා අවසන් දින වන විට මෙම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු අතර ඉහත සඳහන් සුදුසුකම් සනාථ කෙරෙන සියලුම සහතිකවල සහ ජාතික හැඳුනුම්පතේ තමා විසින් සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතු ය.

**02. තෝරා ගැනීමේ ක්‍රමය :**

වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සහිතව වයඹ පළාත් ආණ්ඩුකාරවර ලේකම් විසින් නම් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී, ලබා ගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

**03. අයදුම්පත් ඉදිරිපත් කිරීම :**

සියලුම අයදුම්පත් (ආදර්ශ අයදුම්පත්‍රය www.psc.nw.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිය) විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර 2025.11.30 වැනි දින හෝ ඊට පෙර ලැබෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ අදාළ අමාත්‍යාංශ ලේකම් මඟින් (පළාත් සභාවට අන්තර්ග්‍රහණය වූ නිලධරයෙකු නම් ඔබගේ අයදුම්පත පළාත් අමාත්‍යාංශ ලේකම් හා ප්‍රධාන ලේකම් ගේ නිර්දේශ සහිතව යොමු කළ යුතුය.) "**ආණ්ඩුකාරවර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය, මාලිගාව, කුරුණෑගල**" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"වයඹ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යක්ෂ හා විෂයානුබද්ධ විශේෂඥ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම"** යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැතිවීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් වයඹ පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය විසින් භාර ගනු නොලැබේ.

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවරයා සතු වේ.

මෙම දැන්වීමේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වේ.

මෙම තනතුර සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවරයා සතු වේ.

වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියමය පරිදි,

ආණ්ඩුකාරවර ලේකම්.

2025 නොවැම්බර් මස 07 වැනි දින,
ආණ්ඩුකාරවර කාර්යාලය,
වයඹ පළාත.

**ආදර්ශ අයදුම්පත්‍රය**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.

(✓ සලකුණ යොදන්න)

අතිරේක පළාත් අධ්‍යක්ෂ ☐

විෂයානුබද්ධ විශේෂඥ ☐

**වයඹ පළාත් සහා රාජ්‍ය සේවයේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යක්ෂ හා විෂයානුබද්ධ විශේෂඥ තනතුර සඳහා බඳවා ගැනීම**

***"අ" කොටස***

01\. 1.1. මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) : ...................................................................................................... මයා/මිය/මෙනෙවිය.

1.2. මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : Mr./Ms./Mrs. ......................................................................................................

1.3. සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) : ......................................................................................................

1.4. ස්ත්‍රී/පුරුෂ භාවය : ☐

ස්ත්‍රී - F පුරුෂ - M (අදාළ සංකේතය කොටුව තුළ සඳහන් කරන්න.)

1.5. උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

1.6. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

02\. 2.1. ස්ථිර පදිංචි ලිපිනය : ......................................................................................................

2.2 රාජකාරි ලිපිනය (සිංහලෙන්) : ......................................................................................................

2.3 දුරකථන අංකය : රාජකාරි ........................................................ පෞද්ගලික ........................................................

03\. 3.1. වර්තමාන තනතුර : ......................................................................................................

3.2. පන්තිය හෝ ශ්‍රේණිය : ......................................................................................................

3.3. එම තනතුර සඳහා පත් වූ දිනය : ........................................................

3.4. 2025.11.30 දිනට එම තනතුරේ සක්‍රීය සේවා කාලය : ........................................................................

3.5. පූර්ව සේවා විස්තර :

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ ආයතනය | කාල වකවානුව | | නිලධාරියා දැරූ තනතුර | තනතුර අයත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | දින සිට | දින දක්වා | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

04. අධ්‍යාපන සුදුසුකම් :

4.1. පශ්චාත් උපාධියේ/පශ්චාත් උපාධි ඩිප්ලෝමාවේ/රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක හදාරා ඇති කළමනාකරණ පුහුණු පාඨමාලාවේ (මාස 06කට වැඩි) නම :

.........................................................................................................................................................................

4.2. විශ්වවිද්‍යාලය/ආයතනය : ....................................................................................................................................

4.3. එම පශ්චාත් උපාධිය/පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සම්පූර්ණ කළ දිනය : ...........................................................................
.........................................................................................................................................................................

05. අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ද, මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ බව ප්‍රකාශ කරමි.

දිනය - ................................................ ................................................

අයදුම්කරුගේ අත්සන

---

*"ආ" කොටස*

**අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුව භාර ආසන්නතම මාණ්ඩලික නිලධාරියාගේ සහතිකය**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ...................................................... මයා/මිය/මෙනෙවිය

01. 1.1. පූර්වාසන්නව වසර 05 තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත/නැත.

| වර්ෂය | වාර්ෂික වැටුප් වර්ධක උපයාගෙන ඇත/නැත | කාර්ය සාධන මට්ටම |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

1.2. වැටුප් වර්ධක විලම්භනය කර ඇතිනම් එසේ කිරීමට හේතුව සහ කාල සීමාව

.........................................................................................................................................................................
.........................................................................................................................................................................

02. පූර්වාසන්න වසර 05 තුළ විනය කටයුත්තකට භාජනය වී ඇත/නැත

එසේ විනය කටයුත්තකට භාජනය වී ඇත්නම් ඒ පිළිබඳව තොරතුරු

| වර්ෂය | අදාළ විනය කටයුතු | එහි වත්මන් තත්ත්වය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

(චෝදනා පත්‍ර/විනය නියෝග නිකුත් කර ඇත්නම් ඒවායෙහි සහතික කරන ලද පිටපත් ඇමිණීම අනිවාර්ය වේ)

03. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවම් ලබා ඇත/නැත.
04. උසාවියකින් දඬුවම් ලබා ඇත/නැත.
05. නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් යටතේ වන අවශ්‍යතාවයන් සපුරා ඇත/නැත.
06. ඔහුගේ/ඇයගේ අයදුම්පතෙහි දැක්වෙන විස්තරය මෙම දෙපාර්තමේන්තුවේ ඇති ලේඛන සමග සැසඳෙන බවද, සහතික කරමි/නොකරමි.

.................................. ....................................................

දිනය

මාණ්ඩලික නිලධාරියාගේ අත්සන
නම
නිල මුද්‍රාව

---

*"ඇ" කොටස*

ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

ඉහත සඳහන් තොරතුරු ඉදිරිපත් කර ඇති ......................................................................................... නිලධරයාගේ/නිලධාරිනියගේ පෞද්ගලික ලිපි ගොනුව පරීක්ෂා කළ බවත්, ඒ අනුව එම තොරතුරු නිවැරදි බවට සහතික කරන අතර මෙම නිලධරයා/නිලධාරිනිය විසින් 2025.11.30 දිනට පූර්වාසන්න පස් වසරක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවත්, එම කාල සීමාව තුළ නියමිත වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, කිසිදු විනයානුකූල දඬුවමකට ලක් නොවූ බවත්, මෙම අයට විරුද්ධව යම් විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගැනීමට අදහස් නොකරන බවත්, සහතික කරමි. මෙම තනතුර සඳහා නිලධරයා/නිලධාරිනිය තෝරා ගනු ලැබුවහොත් නිදහස් කිරීමට එකඟ වෙමි.

.......................................... ..............................................

දිනය

ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව

---

අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය :

...................................... ...........................................

දිනය

අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන
නම
නිල මුද්‍රව

---

පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය : (පළාත් සභාවට අන්තර්ග්‍රහණය කර ඇති නිලධාරින් සඳහා පමණි.)

.................................................. .............................................

දිනය

පළාත් ප්‍රධාන ලේකම්ගේ අත්සන
නම
නිල මුද්‍රාව

**අතිරේක පළාත් අධ්‍යක්ෂ තනතුර (සංශෝධිත)**
**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (වයඹ පළාත)**
**සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමේ පරිපාටිය**

| *නිර්ණායක* | *නිර්ණායක හා සම්බන්ධ විස්තර* | |
|---|---|---|
| **01. ජ්‍යෙෂ්ඨත්වය සඳහා උපරිම ලකුණු 40** | I වන ශ්‍රේණියේ වසර 03 ක සේවා කාලයට අමතරව සම්පූර්ණ කර ඇති I වන ශ්‍රේණියේ සේවා කාලය සඳහා ලකුණු ලබාදෙනු ලැබේ.<br><br>වැඩිම අමතර සේවා කාලයක් සහිත නිලධාරියාට ජ්‍යෙෂ්ඨතාවයට වෙන් කර ඇති මුළු ලකුණු ප්‍රමාණය ද සෙසු නිලධාරීන්ට සමානුපාතික ලෙස අමතර සේවා කාලය සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>උදා - බඳවා ගැනීම් පටිපාටි හා සේවා ව්‍යවස්ථාවල ජ්‍යෙෂ්ඨතාවයට 40 ක් හා කුසලතාවයට 60 ක් ලෙස ලකුණු වෙන් කර ඇති අවස්ථාවලදී, වැඩිම අමතර සේවා කාලයක් සේවය කර ඇති නිලධාරියාට මුළු ලකුණු 40 ලබා දිය යුතුය.<br>එම නිලධාරියාගේ මුළු සේවා කාලය වසර 05 ක් වන්නේ නම්,<br>එක් වසරකට ලකුණු 08<br>මාස 06 කට ලකුණු 04<br>මාස 03 කට ලකුණු 02<br>ලෙස සෙසු නිලධාරීන්ට ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>* "සේවා කාලය" යන්නෙන් "සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක්" අදහස් කෙරේ. | |
| **02. කුසලතාවය සඳහා උපරිම ලකුණු 60** | | |
| (අ) කාර්ය සාධන ඉලක්ක ළඟා කර ගැනීම | i. පසුගිය පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක මට්ටමේ කාර්යසාධනය - (වසරකට ලකුණු 01 බැගින්)<br>ii. පසුගිය පූර්වාසන්න වසර 05 තුළ සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ කාර්ය සාධනය - (වසරකට ලකුණු 02 බැගින්)<br>iii. පසුගිය පූර්වාසන්න වසර 05 තුළ විශිෂ්ඨ කාර්ය සාධනය - (වසරකට ලකුණු 03 බැගින්) | උපරිම ලකුණු 15 |
| (ආ) තනතුරේ රාජකාරි කිරීමට ලබා ඇති අත්දැකීම් හා පළපුරුද්ද | i. (අ) නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු වන රාජකාරි කර තිබීම.<br>වසරකට ලකුණු 02 බැගින්<br>(ආ) විෂයානුබද්ධ විශේෂඥ තනතුරෙහි රාජකාරි කර තිබීම<br>වසරකට ලකුණු 03 බැගින්<br>} උපරිම වසර 05 ක් සඳහා<br>(ලකුණු 15)<br><br>ii. අතිරේක පළාත් අධ්‍යක්ෂ තනතුරේ වැඩබැලීම/රාජකාරි ඉටුකිරීම/රාජකාරි ආවරණය සඳහා<br><br>වසරකට උපරිම ලකුණු 05<br>මාස 06 කට වැඩි නම් ලකුණු 03<br>මාස 06 කට අඩු නම් ලකුණු 01 (ලකුණු 05) | උපරිම ලකුණු 20 |
| (ඇ) අධ්‍යාපන සුදුසුකම්<br><br>(ලකුණු ලබා දෙනු ලබන්නේ ඉහළම එක් සුදුසුකමක් සඳහා පමණි.) | i. පශ්චාත් උපාධි (ලකුණු 10)<br><br>ii. පශ්චාත් උපාධි ඩිප්ලෝමා (ලකුණු 08)<br><br>iii. රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක හදාරා ඇති කළමණාකරණ පුහුණු පාඨමාලාව මාස 06 කට වැඩි (එක් සුදුසුකමක් සඳහා පමණි) (ලකුණු 06) | උපරිම ලකුණු 10 |

| *නිර්ණායක* | *නිර්ණායක හා සම්බන්ධ විස්තර* | |
|---|---|---|
| බඳවා ගැනීමේදී හෝ උසස්වීම් සඳහා සලකා බලනු ලබන උසස් අධ්‍යාපන සුදුසුකම් මේ යටතේ සලකා බලනු නොලැබේ. | | |
| (ඇ) දෙපාර්තමේන්තු කාර්යභාරයට දැක්වූ සුවිශේෂී දායකත්වය | i. රාජකාරි ආශ්‍රිත සුවිශේෂී කාර්යභාරයන් (දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.) එක් ක්‍රියාකාරකමක් සඳහා ලකුණු 02 බැගින් (ලකුණු 06)<br><br>ii. ලැබූ ප්‍රශංසාත්මක ලිපි (පොදු 230 බී ආකෘතියෙන් නිකුත් කළ) සේවා ඇගයීම් (පෞද්ගලික ලිපි ගොනුව මඟින් සනාථ වන) එක් ලිපියක් සඳහා ලකුණු 02 බැගින් (ලකුණු 04) | උපරිම ලකුණු 10 |
| (ඉ) සම්මුඛ පරීක්ෂණයේදී දක්වන නිපුණතාවය | පෞරුෂත්වය/මුහුණ දෙන ආකාරය/පිළිතුරක් සැපයීමේදී දක්වන නිපුණතාවය | උපරිම ලකුණු 05 |

**විෂයානුබද්ධ විශේෂඥ තනතුර (සංශෝධිත)**
**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (වයඹ පළාත)**
**සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමේ පරිපාටිය**

| *නිර්ණායක* | *නිර්ණායක හා සම්බන්ධ විස්තර* | |
|---|---|---|
| **01. ජ්‍යෙෂ්ඨත්වය සඳහා උපරිම ලකුණු 40** | I වන ශ්‍රේණියේ වසර 03 ක සේවා කාලයට අමතරව සම්පූර්ණ කර ඇති I වන ශ්‍රේණියේ සේවා කාලය සඳහා ලකුණු ලබාදෙනු ලැබේ.<br><br>වැඩිම අමතර සේවා කාලයක් සහිත නිලධාරියාට ජ්‍යෙෂ්ඨතාවයට වෙන් කර ඇති මුළු ලකුණු ප්‍රමාණය ද සෙසු නිලධාරීන්ට සමානුපාතික ලෙස අමතර සේවා කාලය සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>උදා - බඳවා ගැනීම් පරිපාටි හා සේවා ව්‍යවස්ථාවල ජ්‍යෙෂ්ඨතාවයට 40 ක් හා කුසලතාවයට 60 ක් ලෙස ලකුණු වෙන් කර ඇති අවස්ථාවලදී, වැඩිම අමතර සේවා කාලයක් සේවය කර ඇති නිලධාරියාට මුළු ලකුණු 40 ලබා දිය යුතුය.<br>එම නිලධාරියාගේ මුළු සේවා කාලය වසර 05 ක් වන්නේ නම්,<br>එක් වසරකට ලකුණු 08<br>මාස 06 කට ලකුණු 04<br>මාස 03 කට ලකුණු 02<br>ලෙස සෙසු නිලධාරීන්ට ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>* "සේවා කාලය" යන්නෙන් "සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක්" අදහස් කෙරේ. | |
| **02. කුසලතාවය සඳහා උපරිම ලකුණු 60** | | |
| (අ) කාර්ය සාධන ඉලක්ක ළඟා කර ගැනීම | i. පසුගිය පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක මට්ටමේ කාර්යසාධනය - (වසරකට ලකුණු 01 බැගින්)<br>ii. පසුගිය පූර්වාසන්න වසර 05 තුළ සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ කාර්ය සාධනය - (වසරකට ලකුණු 02 බැගින්)<br>iii. පසුගිය පූර්වාසන්න වසර 05 තුළ විශිෂ්ඨ කාර්ය සාධනය - (වසරකට ලකුණු 03 බැගින්) | උපරිම ලකුණු 15 |

| *නිර්ණායක* | *නිර්ණායක හා සම්බන්ධ විස්තර* | |
|---|---|---|
| (ආ) තනතුරේ රාජකාරි කිරීමට ලබා ඇති අත්දැකීම් හා පළපුරුද්ද | i. (අ) නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ වසරකට ලකුණු 03 බැගින් උපරිම වසර 05 ක් සඳහා (ලකුණු 15)<br>(ආ) විෂයානුබද්ධ විශේෂඥ තනතුරෙහි රාජකාරි ආවරණය/ වැඩබැලීම/රාජකාරි ඉටුකිරීම සඳහා වසරකට උපරිම ලකුණු 05<br>මාස 06 කට වැඩි නම් ලකුණු 03<br>මාස 06ට අඩු නම් ලකුණු 01 | උපරිම ලකුණු 20 |
| (ඇ) අධ්‍යාපන සුදුසුකම්<br>(ලකුණු ලබා දෙනු ලබන්නේ ඉහළම එක් සුදුසුකමක් සඳහා පමණි.) බඳවා ගැනීමේදී හෝ උසස්වීම් සඳහා සලකා බලනු ලබන උසස් අධ්‍යාපන සුදුසුකම් මේ යටතේ සලකා බලනු නොලැබේ. | i. පශ්චාත් උපාධි (ලකුණු 10)<br>ii. පශ්චාත් උපාධි ඩිප්ලෝමා (ලකුණු 08)<br>iii. රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක හදාරා ඇති කළමනාකරණ පුහුණු පාඨමාලාව මාස 06 කට වැඩි (එක් සුදුසුකමක් සඳහා පමණි) (ලකුණු 06) | උපරිම ලකුණු 10 |
| (ඈ) දෙපාර්තමේන්තු කාර්යභාරයට දැක්වූ සුවිශේෂී දායකත්වය | i. රාජකාරි ආශ්‍රිත සුවිශේෂී කාර්යභාරයන් (දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.) එක් ක්‍රියාකාරකමක් සඳහා ලකුණු 02 බැගින් (ලකුණු 06)<br>ii. ලැබූ ප්‍රශංසාත්මක ලිපි (පොදු 230 බී ආකෘතියෙන් නිකුත් කළ) / සේවා ඇගයීම් (පෞද්ගලික ලිපි ගොනුව මඟින් සනාථ වන) එක් ලිපියක් සඳහා ලකුණු 02 බැගින් (ලකුණු 04) | උපරිම ලකුණු 10 |
| (ඉ) සම්මුඛ පරීක්ෂණයේදී දක්වන නිපුණතාවය | පෞරුෂත්වය/මුහුණ දෙන ආකාරය/පිළිතුරක් සැපයීමේදී දක්වන නිපුණතාවය | උපරිම ලකුණු 05 |

EOG 11 - 0111

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.